# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2278/15 – 2022 මැයි මස 05 වැනි බ්‍රහස්පතින්දා – 2022.05.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**බතික් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1)(ආ) වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ, 1979 අගෝස්තු මස 03 වැනි දින අංක 48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලය ප්‍රකාරව කම්කරු කොමසාරිස් ජනරාල් බී කේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති වන මම බතික් කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යා කොට ඇති උපලේඛනයෙහි දැක්වෙන කාලම්මිමේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය එම ආඥාපනතේ 33(2) වගන්තිය අනුව තීරණය කිරීමට අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දක්වෙන විරෝධතාවයන් 2022 මැයි මස 18 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියස'',
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

බතික් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලද වර්ෂ 1979 නොවැම්බර් මස 30 වැනි දින අංක 64/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, අවසන් වරට 2013 ජනවාරි මස 03 වැනි දින අංක 1791/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* සඳහන් උපලේඛනය පහත සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

| *I වැනි තීරය* *සේවක පන්තිය* | *II වැනි තීරය* *වැඩ කරන දවසක් සඳහා වූ වේතන ප්‍රමාණය* *රු. ශත* |
|---|---|
| *(අ)* චිත්‍ර ශිල්පී, මෝස්තරකරු | 635.00 |
| *(ආ)* තම්බන්නෝ, සායම් පොවන්නෝ | 545.00 |
| *(ඇ)* මදින්නෝ, පිටිපත් ගන්නෝ, ඉටි කරන්නෝ | 500.00 |

EOG 05 - 0019/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පෙර පාසල් සේවා කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1)(අ) වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ, 2000 පෙබරවාරි මස 21 වැනි දින අංක 1120/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලය අනුව කම්කරු කොමසාරිස් ජනරාල් බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති වන මම පෙර පාසල් සේවා කර්මාන්තයෙහි නියුක්ත ගුරුවරුන් සහ සහායකයින් සම්බන්ධයෙන් පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන අවම වේතන ප්‍රමාණය එම ආඥාපනතේ 33(2) වැනි වගන්තිය අනුව තීරණය කිරීමට අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

යෝජිත තීරණය පිළිබඳව දැක්වෙන විරෝධතාවයන් 2022 මැයි මස 18 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියස'',
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

පෙර පාසල් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 2000 පෙබරවාරි මස 21 වැනි දින අංක 1120/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, අවසන් වරට වෙනස් කරන ලද 2019 අගෝස්තු මස 26 වැනි දින අංක 2138/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* සඳහන් උපලේඛනය පහත සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

| *පළමුවන තීරය (ප්‍රදේශය)* | *දෙවන තීරය (වෘත්තිය)* | *තුන්වන තීරය (අවම මාසික වේතනය) රු. ශත* |
|---|---|---|
| මහ නගර සභා සීමාව තුළ | (අ) ගුරුවරුන්<br>(ආ) සහායකයින් | 16,875.00<br>14,375.00 |
| නගර සභා සීමාව තුළ | (අ) ගුරුවරුන්<br>(ආ) සහායකයින් | 15,937.50<br>13,750.00 |
| ප්‍රදේශීය සභා සීමාව තුළ | (අ) ගුරුවරුන්<br>(ආ) සහායකයින් | 14,062.50<br>12,500.00 |

ඉහත (ආ) සළකුණෙන් දැක්වෙන සේවාවන්ට ඉහත (අ) සළකුණෙන් දැක්වෙන සේවාවට අනුෂාංගික වූ කිසියම් සේවාවක් වේ නම් ඒවා ද ඇතුළත් වේ.

EOG 05 - 0019/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.